06 ඒකකය - කාලය(1)

➢ දශක, සියවස් හා සහස්‍ර

- දශකය - වසර දහයක කාල පරිච්ඡේදයකි.
- සියවස - වසර සියයක කාල පරිච්ඡේදයකි.
- සහස්‍රය - වසර දහසක කාල පරිච්ඡේදයකි.

✓ ක්‍රි.ව. 1763 සලකමු.

- $1763 \div 10 = 176$ ඉතිරි 3
  ∴ ක්‍රි.ව.1763 යනු $176 + 1 = 177$ වන දශකයයි.
- $1763 \div 100 = 17$ ඉතිරි 63
  ∴ ක්‍රි.ව.1763 යනු $17 + 1 = 18$ වන සියවසයි.
- $1763 \div 1000 = 1$ ඉතිරි 763
  ∴ ක්‍රි.ව.1763 යනු $1 + 1 = 2$ වන සහස්‍රයයි.

✓ ක්‍රි.ව. 1763 සලකමු.

- $1900 \div 10 = 190$ ඉතිරි 0
  ∴ ක්‍රි.ව.1900 යනු 190 වන දශකයයි.
- $1900 \div 100 = 19$ ඉතිරි 0
  ∴ ක්‍රි.ව.1900 යනු 19 වන සියවසයි.
- $1900 \div 1000 = 1$ ඉතිරි 900

∴ ක්‍රි.ව.1763 යනු $1 + 1 = 2$ වන සහස්‍රයයි.

➢ අධික වර්ෂ

යම් වර්ෂයක් දැක්වෙන සංඛ්‍යාව 100 ගුණාකාරයක් නොවේ නම්, එම සංඛ්‍යාව 4න් බෙදේ නම්, එය අධික අවුරුද්දකි.

100 ගුණාකාරයක් වන වර්ෂයක් අධික අවුරුද්දක් වන්නේ එය 400න් බෙදේ නම් පමණි.

ක්‍රි.ව. 2000 අධික අවුරුද්දක් ද? $2000 = 100 \times 20$ නිසා 2000, 100හි ගුණාකාරයකි. $2000 \div 400 = 5$ නිසා 2000, 400න් බෙදේ. ∴ ක්‍රි.ව. 2000 අධික අවුරුද්දකි.	ක්‍රි.ව. 1900 අධික අවුරුද්දක් ද? 1900, 100හි ගුණාකාරයකි. 1900, 400න් නොබෙදේ. ∴ ක්‍රි.ව. 1900 අධික අවුරුද්දක් නොවේ.
ක්‍රි.ව. 2008 අධික අවුරුද්දක් ද? 2008, 100හි ගුණාකාරයක් නොවේ. $2008 \div 4 = 502$ නිසා 2008, 4න් බෙදේ. ∴ ක්‍රි.ව. 2008 අධික අවුරුද්දකි.	ක්‍රි.ව. 2010 අධික අවුරුද්දක් ද? 2010, 100හි ගුණාකාරයක් නොවේ. හාජ්‍යතා රීති අනුව 2010හි අග ඉලක්කම් දෙකෙන් සෑදුණු සංඛ්‍යාව වන 10, 4න් නොබෙදේ. ∴ 2010, 4න් නොබෙදේ. ∴ ක්‍රි.ව. 2010 අධික අවුරුද්දක් නොවේ.

➢ **ඔබේ ගණිතය පෙළ පොතෙහි 6.1, 6.2 අභ්‍යාස සම්පූර්ණ කරන්න.**